**ශීර්ෂය 217 - පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශය පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියලුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණය ද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වේ. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 217 පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාල පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජූලි 31 දින දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේ දී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.9 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටු කිරීමේ දී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශ ගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128 ප්‍රකාරව ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | | **ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|---|
| මුදල් රෙගුලාසි 128(i)(අ) | රජය විසින් නියම කර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම | 1 | ප්‍රසම්පාදන කටයුතු සැලසුම් නොකිරීම/ ප්‍රමාණවත් පරිදි සැලසුම් නොකිරීම | 2.3 (අ) |
| | | 2 | ප්‍රධාන කාර්යයන්ට පටහැනි කාර්යයන් | 2.2.1 |
| | | 3 | අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම | 2.2.2 |
| | | 4 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.3(ආ) |
| | | 5 | අනාර්ථික ගනුදෙනු | 2.6 |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදින බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බවට. | | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම | 2.8 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 2.1 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයන්

(අ) නීතිය සමඟ ගැටුම් ඇති කර ගත් හා අනාථ, අත්හල හා අසරණ දරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා ඔවුන් පුනරුත්ථාපනය කිරීම.

(ආ) ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනය හා තහවුරු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.

(ඇ) පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවලට අවශ්‍ය තාක්ෂණික දැනුම හා නීති උපදෙස් ලබා දීම.

(ඈ) ළමා අයිතිවාසිකම් සම්බන්ධව පවතින අණ පනත් ජාතික/අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි සංශෝධනය කිරීම.

(ඉ) පවතින අභ්‍යන්තර වත්කම් හා කළමනාකරණ ක්‍රමයන් වැඩිදියුණු කිරීම සහ කාර්යක්ෂමව ළමා අයිතිවාසිකම් සුරැකීමට හැකි මනා කාර්ය මණ්ඩලයක් පුහුණු කිරීම.

## 2.2 කාර්යසාධනය

### 2.2.1 ප්‍රධාන අරමුණුවලට අදාළ කාර්යවලින් බැහැරව ක්‍රියා කිරීම

2017 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව, ක්‍රියාකාරි සැලැස්ම හා දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

ශ්‍රී ලංකාවේ සමාජ පසුබිම තුළ අනාථ, අත්හල හා අසරණ ළමුන්ගේ ද, නීතිමය ගැටළුවලට බඳුන් වූ ළමුන්ගේ ද අයිතිවාසිකම්, පූර්ණ සංවර්ධනය හා ආරක්ෂාව සුරැකෙන ලෙස ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ප්‍රතිපත්ති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම, ඇගයීම යන කටයුතු සම්බන්ධ කර ජාතික යාන්ත්‍රණයක් ලෙස කටයුතු කිරීම දෙපාර්තමේන්තුවේ මෙහෙවර වුවද, 1956 වර්ෂයේ ආරම්භ වූ දෙපාර්තමේන්තුව වර්ෂ 60 ක් ගතවී තිබුණත් ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි විශ්ව ප්‍රඥප්තියට අනුකූලව ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම හා ඊට අදාල නීති සම්පාදනය කිරීම 2017 වර්ෂය වන විටත් සිදුකර නොතිබුණි.

### 2.2.2 ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිවුන් දරුවන් 227 දෙනෙකුට ආධාර ගෙවීම සඳහා රු.893,000 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාල 23 කට ලබා දී තිබුණි. එසේ වුවද, ලබාදුන් ලිඛිත සාක්ෂි අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් නිවුන් දරුවන් 126 දෙනෙකුට පමණක් රු.537,500 ක ආධාර ලබා දී තිබුණි. ඒ අනුව, කාර්යසාධන වාර්තාවල දක්වා තිබූ ඉලක්කයේ නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි වුණි.

(ආ) ප්‍රතිලාභීන් 229 දෙනෙකුට රු.මිලියන 1.13 ක් වෛද්‍ය ආධාර හා හදිසි විපත් ආධාර ලෙස බෙදා දී ඇති බව කාර්යසාධන වාර්තාවල දක්වා තිබුණි. එසේ වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල එවන ලද තොරතුරුවලට අනුව ප්‍රතිලාභීන් 109 දෙනෙකුට පමණක් රු.මිලියන 0.618 ප්‍රතිලාභ ලබා දී තිබුණි.

(ඇ) ළමුන් සඳහා වූ සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 96.22 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් කාර්යයන් 25 ක් ඇතුලත් කර ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණි. එහි ප්‍රගතිය පරීක්ෂා කිරීමේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර තිබූ කාර්යයන්වලින් රු.මිලියන 5.5 ප්‍රතිපාදන සලසා තිබූ පහත සඳහන් කාර්යයන් 4 සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාත්මක කර නොතිබුණි.

- දිස්ත්‍රික් ලේකම්වරුන් සහ සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන් සඳහා දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම.
- ආබාධ සහිත දරුවන්හට ළමා සමාජ/ළමා සභා තුල ක්‍රියාකාරී ලෙස සහභාගි වීමට හැකියාව ඇති කිරීම සඳහා විශේෂ ක්‍රියාමාර්ග ගැනීම.
- ජාතික පර්යේෂණ සම්මේලනයක් පැවැත්වීම,ශ්‍රී ලංකාවේ රඳවා තබා ගැනීමේ හා රැකවරණ ආයතන තුල සිටින ළමා වෙළඳාමේ ගොදුරු බවට පත් වූවන් හඳුනා ගැනීම.
- සම්බන්ධීකරණය හා සංවිධානය යන කාර්යයන්.

(ii) දරුවන් සමඟ කටයුතු කරන සියළු නිලධාරින් පුහුණු කිරීම හා නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම යන කාර්යයන් දෙක සඳහා රු.මිලියන 3.720 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඒවායේ ප්‍රගතිය පිළිවෙලින් සියයට 20 ක් හා සියයට 15 ක් වූ අඩු ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලියාපදිංචි ළමා සමාජ සංඛ්‍යාව 4445 ක් වී තිබුණි. ළමා සභා පිහිටුවීම, ළමා සමාජ හා ළමා සභා වැඩසටහන් පවත්වාගෙන යාම සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 8.1 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 කට ද ජාතික ළමා සභා වැඩසටහන සඳහා රු.මිලියන 1.67 ක් ද දෙපාර්තමේන්තුව විසින් වැය කර තිබුණි. එසේ වුවද, ළමා සමාජ අඛණ්ඩව ක්‍රියාකාරීව පවත්වා ගෙන යා හැකි පරිදි සකස් කළ සුදුසු වැඩසටහන් හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම සඳහා නිලධාරින් මෙහෙයවා නොතිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේ දී ළමා අපයෝජන සම්බන්ධයෙන් පැමිණිලි 12,093 ක් ලැබී තිබුණි. ඉන් පැමිණිලි 6,232 ක් සඳහා පමණක් පූර්ණ කාලීන විසඳුම් ලබා දී තිබුණි. පැමිණිලි 3,569 ක් සඳහා තාවකාලික විසඳුම් ලබා දී තිබුණු අතර, පැමිණිලි 2,268 ක් විසඳුම් සඳහා වෙනත් ආයතන වෙත යොමු කර තිබුණි. පැමිණිලි 24 සඳහා පිළිතුරු ලබා දී නොතිබුණු අතර, එම පැමිණිලි සඳහා ලබා දුන් විසඳුම් පිළිබඳ පසුවිපරම් කර නොතිබුණි.

(ඉ) ළමා නිවාස සුපරීක්ෂණය වැය විෂයය යටතේ රු.මිලියන 5 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ක්‍රියාකාරී සැලැස්මට අනුව ළමා නිවාස 140 ක් අධීක්ෂණය කිරීම සඳහා රු.මිලියන 4.969 ක ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය තුල දී සම්පූර්ණම ප්‍රතිපාදනය යොදා ගෙන ළමා නිවාස 16 ක් පමණක් සුපරීක්ෂණය කර තිබුණි.

(ඊ) ළමා නිවාස 13 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා රු.මිලියන 5 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී ඉන් රු.මිලියන 4.923 ක් වැය කර ළමා නිවාස 7 ක් පුනරුත්ථාපනය කර ඇති බව කාර්යසාධන වාර්තාවේ දක්වා තිබුණි. එසේ වුවද රු.මිලියන 4.689 ක් වැය කර ළමා නිවාස 4 ක් පමණක් පුනරුත්ථාපනය කර තිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(උ) ප්‍රජා මූලික ළමාරක්ෂක ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ අරමුණින් මාධ්‍ය හා ප්‍රකාශන 05 ක් නිෂ්පාදනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.610,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ප්‍රතිපාදනයෙන් රු.562,000 ක් උපයෝජනය කර දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය නිර්මාණය කර තිබුණි.

(ඌ) ළමා අයිතිවාසිකම් පිළිබඳව වතු අංශයේ වැඩසටහන් 200 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 01 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර, ඉන් රු.මිලියන 0.859 ක් වැය කර වැඩසටහන් 32 ක් පමණක් පවත්වා තිබුණි.

(එ) මානව සම්පත් සංවර්ධනය යටතේ දෙපාර්තමේන්තුවේ සම්පත් සංචිතය වැඩිදියුණු කිරීමේ අරමුණින් වැඩසටහන් 3 ක් සඳහා රු.361,000 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර, එම මුළු ප්‍රතිපාදනයම උපයෝගී කර වැඩසටහන් 01 ක් පමණක් පවත්වා තිබුණි.

(ඒ) වීදි දරුවන් හා ඔවුන්ගේ භාරකරුවන් සඳහා සායන පැවැත්වීම තුළින් සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වය නංවාලීමේ අරමුණෙන් වීදි දරුවන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් 08 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.200,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඉන් රු.157,000 ක් වැය කර වැඩසටහන් 05 ක් පවත්වා ඇති බව කාර්යසාධන වාර්තාවල දක්වා තිබුණ ද, වැඩසටහන් 4ක් පමණක් පවත්වා තිබුණි. මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත යවන ලද රු.30,000 ක ප්‍රතිපාදන, අරමුණින් බැහැරව ළමයින් 15 දෙනෙකු සඳහා පාසල් උපකරණ ලබා දී තිබුණි. තවත් දිස්ත්‍රික්කයක වැඩසටහන් පැවැත් වූ බවට වියදම් වාර්තා හා ප්‍රගතිය පිළිබඳ වාර්තා ගෙන්වා ගෙන නොතිබුණි.

## 2.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයීම් හා සේවා ලබා ගැනීම

---

දෙපාර්තමේන්තුව විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබා ගැනීම සඳහා ප්‍රතිපාදිත රු.මිලියන 5.034 න් රු.මිලියන 4.495 ක් උපයෝජනය කර පහත දැක්වෙන සේවාවන් ලබා ගෙන තිබුණි.

| වැය විෂයය | වැය විෂයය විස්තරය සැපයීම් | සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය |
|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 2.3 | 2.2 | 0.1 |
| 1203 | ආහාරපාන හා නිල ඇඳුම් | 1.3 | 0.967 | 0.333 |
| 1204 | වෛද්‍ය සැපයීම් | 0.034 | 0.028 | 0.006 |
| **මූලධන වත්කම් අත්පත් කරගැනීම** | | | | |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 1.4 | 1.3 | 0.1 |
| | **එකතුව** | **5.034** | **4.495** | **0.535** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ප්‍රසම්පාදන සැලසුම් කිරීම හා ප්‍රාරම්භක අවධිය**

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ii) 4.2.2 (අ), (ආ) මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රසම්පාදන කාලසටහන් පිළියෙල කර නොතිබුණි.

(iii) ප්‍රසම්පාදන කාර්යයන් සඳහා සවිස්තරාත්මකව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(iv) පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම වාර්ෂික අයවැය සමඟ අනුගත වී නොතිබුණි.

**(ආ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම**

(i) ළමා අයිතිවාසිකම් පිළිබඳ වීඩියෝ පට 4 ක් නිෂ්පාදනය කිරීම සඳහා රු.මිලියන 1.81 ක් වැය කර තිබුණි. එම ප්‍රසම්පාදනයේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.1 (ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු කැඳවීමේ ලේඛන පිළිවෙලින් තාක්ෂණ ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව විසින් පරීක්ෂා කර අනුමත කර නොතිබීම, ලංසුකරුවන් නියමිත ආකෘති පත්‍ර අනුව ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කර නොතිබීම, ලංසු ඉදිරිපත් කිරීමේ අවම කාලය සැලකිල්ලට නොගැනීම, නියමිත ආකෘති පත්‍රවල ලංසු විවෘත කිරීම පිළිබඳ වාර්තා නොතිබීම යනාදි අඩුපාඩු නිරීක්ෂණය විය.

(ii) පරත්ත ළමා පුහුණු උපදේශන මධ්‍යස්ථානයට රු.මිලියන 1.19 ක් වටිනා කැමරා පද්ධතියක් සවි කිරීමේ ප්‍රසම්පාදනයේ දී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6අ(ii) මාර්ගෝපදේශය ප්‍රකාරව තාක්ෂණික ඇගයීමේ කමිටුව විසින් පිළිවිතර සමාලෝචනය හා අනුමත කිරීම සිදු කර නොතිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව මිල කැඳවීම් කිරීමකින් තොරව සම්මේලනයක් සඳහා රු.100,000 ක් වැය කර ශ්‍රවනාගාරයක් වෙන් කරවා ගෙන තිබුණි.

## 2.4 වාහන උපයෝජනය

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂය අවසන් වන විට පහත සඳහන් පරිදි වාහන 5 ක් පැවති අතර, එම වාහනවලින් කිලෝමීටර 75,537 ක් ධාවනය කර තිබුණි. ඒ සඳහා ඉන්ධන හා ලිහිසිතෙල් වෙනුවෙන් රු.620,408 ක් ද, වාහන සේවා කිරීම වෙනුවෙන් රු.237,740 ක් ද, වාහන අළුත්වැඩියා වෙනුවෙන් රු.1,153,716 ක් ද වාහන රක්ෂණය කිරීම වෙනුවෙන් රු.310,936 ක් ද වශයෙන් එකතුව රු. 2,322,800 ක් වැය කර තිබුණි. දෙපාර්තමේන්තුව විසින් වාහන ධාවනය කිරීම සඳහා රියදුරු වැටුප් හා දීමනා හැර කිලෝමීටරයක් සඳහා රු. 30 ක් වැය කර තිබුණි.

| වාහන වර්ගය | වාහන ගණන | වටිනාකම | රියැදුරු වැටුප් හා දීමනා හැර අනෙකුත් වියදම් | ධාවනය කල කිලෝමීටර ගණන | ධාවනය කල කිලෝමීටරයක් සඳහා වියදම |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | | රු. |
| කැබ් | 01 | තොරතුරු නැත | 562,238 | 20,211 | 19.92 |
| කාර් | 01 | 3,058,323 | 628,062 | 22,890 | 27.31 |
| වෑන් | 02 | 10,550,000 | 589,214 | 30,491 | 34.86 |
| ජීප් | 01 | තොරතුරු නැත | 543,287 | 1,945 | 109.86 |

## 2.5 ඉන්ධන දහනය වීම් පරීක්ෂා නොකිරීම

2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අයත් වාහන 05 ක් සමාලෝචිත වර්ෂයේදී ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂා කර නොතිබුණි.

## 2.6 අනාර්ථික ගනුදෙනු

ළමා අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා දරුවන්ට ළමා අයිතිවාසිකම් පිළිබඳව සුහදශීලි අයුරින් දැනුවත් භාවයක් ලබා දීම අරමුණු කර ගෙන තේමා 4 ක් යටතේ වීඩියෝ පට 4 ක් නිර්මාණය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 1.81 ක් වැය කර තිබුණි. එසේ වුවද එම වීඩියෝ පට 2018 ජූනි 25 විගණන දින වන විටත් කිසිදු පුහුණු කටයුත්තක් සඳහා භාවිතා කර නොතිබුණි.

**2.7 විසඳා නොතිබුණු විගණන ඡේද**

දෙපාර්තමේන්තුවට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුලත්ව තිබූ විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංක** | |
| 2016 | 4(iv) | පර්යේෂණ 3 ක් සඳහා රු.මිලියන 4.9 ක් වැය කර තිබූ අතර, එම පර්යේෂණ වාර්තාවලින් ලබා ගත් නිර්දේශ හා නිගමන දෙපාර්තමේන්තුවේ මෙහෙවර සඳහා යොදා ගෙන තිබුණි. |
| | 4(අ) | 1956 වර්ෂයේ ආරම්භ වූ දෙපාර්තමේන්තුව ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි විශ්ව ප්‍රඥප්තියට අනුකූලව ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම හා ඊට අදාල නීති සම්පාදනය කර නොතිබුණි. |

**2.8 වත්කම් කළමනාකරණය**

2017 ජූනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වත්කම් සම්බන්ධ තොරතුරු යවා ඇතත් ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන නොකිරීම හේතුවෙන් එම යවන ලද වාර්තාවල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

**2.9 මානව සම්පත් කලමනාකරණය**

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.15,564,918 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු. 34,820 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 06 | 03 | 03 | - |
| (ii) | තෘතියික මට්ටම | 238 | 236 | 02 | - |
| (iii) | ද්විතියික මට්ටම | 228 | 193 | 35 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 17 | 14 | 03 | - |
| (v) | අනියම්/කොන්ත්‍රාත් | - | 01 | - | 01 |
| | | **489** | **447** | **43** | **01** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 43 ක් පැවති අතර, ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 3 ක් පැවතීම නිසා සැලැසුම් සකස් කිරීම හා අධීක්ෂණ කටයුතු නිසියාකාරව සිදු නොවීමත්, ද්විතියික මට්ටමේ තනතුරු 35 ක පුරප්පාඩු පැවතීම නිසා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු ද නිරීක්ෂණය විය.